සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

යුරෝපා ඉතිහාසය - ඈත ඉතිහාසයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට නොගැළපෙන නම හඳුනාගෙන ඊට අදාළ අංකය තිත් ඉරමත යොදන්න.

(01) (1) කැරිබියන් මුහුද (2) ඊරල් මුහුද (3) ඇසොව් මුහුද
(4) කැස්පියන් මුහුද (5) ටර්ටරා මුහුද (......)

(02) (1) කොස් (2) සමෝස් (3) එල්බා
(4) ලෙස් බෝස් (5) ඩීලෝස් (......)

(03) (1) තෝමස් හොබ්ස් (2) ජෝන් ලොක් (3) ෆැන්සිස්කෝ ගුයිසියාසිනි
(4) ජීන් ජැක්වින් රූසෝ (5) ජීන් බෝඩෑන් (......)

(04) (1) ජෝන් හස් (2) උල්රිච් ස්වින්ගි (3) ජෝන් කැල්වින්
(4) ජෝන් ටෙට්සල් (5) ජෝන් වයික්ලිෆ් (......)

(05) (1) ලැන්කැස්ටර් (2) ටියුඩර් (3) ෆ්‍රැන්ස්
(4) ජී හැනෝවර් (5) යෝර්ක් (......)

(06) (1) පාර්ලිමේන්තුව (2) ස්ටාර් චෙම්බර් (3) කෝටීස්
(4) සූමා (5) ස්ටේට්ස් ජෙනරාල් (......)

(07) (1) බොස්පරස් (2) පිරනීස් (3) තීබ්ස්
(4) ඇපිනයින් (5) ඇල්ප්ස් (......)

(08) (1) පැට්‍රිෂියන්වරු (2) සැකසන් වරු (3) ෆ්‍රැන්ක්වරු
(4) ඇන්ගල්වරු (5) හක්වරු (......)

(09) (1) කෲෂෙෆ් (2) බ්‍රෙෂ්නෙෆ් (3) සොල්ෂෙනිට්සින්
(4) ගොර්බචොෆ් (5) අන්ද්‍රොපොෆ් (......)

(10) (1) ඔලිවර් ක්‍රොම්වෙල් (2) ජේම්ස් හාග්‍රීව්ස් (3) රිචඩ් ආක්රයිට්
(4) තෝමස් නිව්කොමන් (5) රිචඩ් ආක්රයිට් (......)

- **අංක 11 සිට 20 දක්වා වූ ප්‍රශ්න සඳහා දී ඇති යුගල අතරින් එකක් නොගැළපේ. නොගැළපෙන යුගලයට අදාළ අංකය තිත් ඉරමත ලියන්න.**

(11) (1) හසයිට්වරු — බොහිමියාව
(2) ලූතර්වාදීන් — ග්‍රීසිය
(3) පියුරිටන්වරු — බ්‍රිතාන්‍යය
(4) ප්‍රෙස්බියන්වරු — ස්කොට්ලන්තය
(5) හ්‍යුගනෝවරු — ප්‍රංශය (......)

(12) (1) යෝර්ක් — වෙනීසිය
(2) ගොන්යාගා — මැන්ටුවා
(3) මෙඩිචි — ෆ්ලෝරන්ස්
(4) එස්තේ — ෆෙරාරා
(5) ස්ෆෝර්යා — මිලාන් (......)

(13) (1) ඉලියඩ් — ඔඩිසි
(2) හෙරඩෝටස් — තුසිඩිඩීස්
(3) රෝමවරු — මිලේච්ඡයෝ
(4) ලිවි — ටැසිටස්
(5) රොමියුලස් — රීටස් (......)

(14) (1) සියුස් — ජුපිටර්
(2) ඇතීනා — මිනර්වා
(3) ඇෆ්‍රොඩයිට් — වීනස්
(4) පොසීඩන් — නෙප්චූන්
(5) ඇපලෝ — සාතන් (......)

(15) (1) වැඩවසම් ක්‍රමය — සාමූහිකත්වය
(2) පුනරුදය — මානව වාදය
(3) ජාතික රාජ්‍යය — නව රාජාණ්ඩුව
(4) ප්‍රති රෙපරමාදුව — අධර්ම මර්ධනාධිකරණය
(5) සමාජවාදය — බද්ධ ව්‍යාපාර (......)

(16) (1) සියක් අවුරුදු යුද්ධය — එංගලන්තය සහ ස්පාඤ්ඤය
(2) නයිල් සටන — ප්‍රංශය සහ එංගලන්තය
(3) ජේනා සටන — ප්‍රංශය සහ රුසියාව
(4) මැජෙන්ටා සටන — සාඩිනියාව සහ ඔස්ට්‍රියාව
(5) සත් සති යුද්ධය — ඔස්ට්‍රියාව සහ ප්‍රශියාව (......)

(17) (1) ජේසුයිට් — නිකායකි.
(2) කබොනාරි — රහස් සංවිධානයකි
(3) සොල්වරයින් — තීරු බදු සමාගමකි
(4) දාස් කැපිටාල් — ලෙනින්ගේ කෘතියකි
(5) ජුන්කර් — ඉඩම් හිමි ප්‍රශියානු රදළයින් (......)

The National e-Learning Portal for The General Education

(18) (1) ජැකොබින් — ප්‍රංශය
(2) මෙන්ෂෙවික්වරු — ස්පාඤ්ඤය
(3) බෝල්ෂෙවික්වරු — රුසියාව
(4) නට්සිවාදීන් — ජර්මනිය
(5) ෆැසිස්ට්වාදීන් — ඉතාලිය (......)

(19) (1) ගාර්ඩිනියා — පීඩ් මොන්ට්
(2) ඇල්සාස් — ලොරේන්
(3) සැවෝයි — රෝමඤ්ඤ
(4) බර්ලින් — බැග්ඩෑඩ්
(5) ලෙනින් ග්‍රෑඩ් — ව්ලැඩිවොස්ටොක් (......)

(20) (1) IV හෙන්රි — ප්‍රංශ රජ කෙනෙක්
(2) VII හෙන්රි — එංගලන්ත රජ කෙනෙක්
(3) චාල්ස් ඇල්බට් — ස්පාඤ්ඤයේ රජ කෙනෙක්
(4) I නිකොලස් — රුසියාවේ සාර්වරයෙක්
(5) I විලියම් — ජර්මන් කයිසර්වරයෙක් (......)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවල ඇති x සහ y තීරුවල සඳහන් සංයෝග අනුපිළිවෙලින් ගලපා ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.**

| | x | | y |
|---|---|---|---|
| (21) | (i) බර්තලමියු ඩයස් | A | බහමා දූපත් |
| | (ii) ක්‍රිස්ටෝපර් කොලම්බස් | B | බෙටන් තුඩුව |
| | (iii) ජෝන් කැබෝ | C | බ්‍රසීලය |
| | (iv) කබ්රාල් | D | ශුභ පැත්මේ තුඩුව |
| | (v) මාර්ක් විටේ | E | ක්විබෙක් |

(1) DABCE (2) DBACE (3) CBADE (4) BCAED (5) ABCED (......)

| | | | |
|---|---|---|---|
| (22) | (i) රතු රෝස | A | ජැකොබින් |
| | (ii) ලැන්කැස්ට්‍රියන් | B | බොල්ෂෙවික් |
| | (iii) විග් | C | යෝර්ක් |
| | (iv) ගිරොසන් | D | සුදු රෝස |
| | (v) මෙක්ෂවික් | E | ටෝරි |

(1) DECBA (2) DCEAB (3) BCADE (4) ABCDE (5) DECBA (......)

| | | | |
|---|---|---|---|
| (23) | (i) මකියාවෙලි | A | විප්ලවය නම් මමය. |
| | (ii) වස්කෝ ද ගාමා | B | රාජ්‍යය නම් මම වෙමි. |
| | (iii) XIV ලුවී | C | එය ඉතාලියට තනිව කර ගත හැක. |
| | (iv) නැපෝලියන් බොනපාර්ට් | D | පාලකයා සිංහයා මෙන්ම හිවලා ද අනුකරණය කළ යුතුය. |
| | (v) මැසිනි | E | අපි කුළු බඩු හා ක්‍රිස්තියානින් සොයා පැමිණියෙමු. |

(1) EADBC (2) EDBAC (3) ABCDE (4) DEBAC (5) BAEDC (......)

The National e-learning Portal for The General Education

(24) (i) VII හෙන්රි — A II නිකොලස්ගේ පියා
(ii) V චාල්ස් — B වික්ටර් එමැනුවෙල්ගේ පියා
(iii) IV හෙන්රි — C XIII ලුවීගේ පියා
(iv) චාල්ස් ඇල්බට් — D VIII හෙන්රිගේ පියා
(v) III ඇලෙක්සැන්ඩර් — E II පිලිප්ගේ පියා

(1) DECBA (2) EDCBA (3) CBAED (4) DBAEC (5) DBCAE (......)

(25) (i) උත්කෘෂ්ට විප්ලවය — A මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය
(ii) ප්‍රංශ විප්ලවය — B මහජන ප්‍රඥප්තිය
(iii) චාර්ටිස්ට් ව්‍යාපාරය — C ෆ්‍රැන්ක්ෆර්ට් සම්මේලනය
(iv) 1848 ජර්මන් විප්ලවය — D අයිතිවාසිකම් පණත
(v) බොල්ෂෙවික් විප්ලවය — E නිර්ධන පාන්තික ආඥාදායකත්වය

(1) DECBA (2) CDEAB (3) DABCE (4) BDAEC (5) EDABC (......)

- **අංක 26 සිට 30 තෙක් වූ ප්‍රශ්න වල මාතෘකාවට නොගැළපෙන කරුණ ඇතුළත් වරණය තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

(26) ප්‍රංශ විප්ලවය,
(1) ''ටෙනිස් පිටියේ දිවුරුම'' ආරම්භය සනිටුහන් කරයි.
(2) 1789 ජූනි 14 බැස්ටීලය බිඳ දමයි.
(3) දාහත්වන ලුවී රජ කෙනෙක් ලෙස පත් කරයි.
(4) විප්ලවයෙන් මධ්‍යම පන්තිය ප්‍රතිලාභ ලැබූහ. (......)

(27) කාර්මික විප්ලවය,
(1) පළමුව ඉතාලියෙන් ඇරඹේ.
(2) එමගින් යුරෝපයේ ඵලදායිතාව වර්ධනය කළේය.
(3) ග්‍රාමීය කෘෂිකාර්මික රටාව තාක්ෂණයෙන් නව්‍යකරණය විය.
(4) එංගලන්තයේ ශ්‍රමය, සම්පත් ප්‍රයෝජනවත් විය. (......)

(28) වැඩවසම් ක්‍රමය,
(1) රදළ ප්‍රභූ පන්තිය
(2) ප්‍රවේණි දාසයින්ගේ ශ්‍රමය
(3) ස්වයං පෝෂිත ආර්ථිකය
(4) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව (......)

(29) පුනරුදය,
(1) ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයකි.
(2) කුරුස යුද්ධයෙන් පසු සිදු විය.
(3) ඉතාලිය මුල් විය.
(4) මානව වාදය ඉස්මතු විය.
(5) සාහිත්‍ය හා කලා ක්ෂේත්‍රවල ඇතිවිය. (......)

(30) නැපෝලියන් බොනපාට්,

(1) 1804 දී ප්‍රංශයේ අධිරාජයා විය.

(2) ප්‍රංශයේ දේශ සීමා පුළුල් කළේය.

(3) ඒකාබද්ධ නීති පද්ධතියක් සැකසීය.

(4) වෝටලු හි දී ඔහු විසින් හමුදා පරාජය කරන ලදී. (......)

- **අංක 31 සිට 35 තෙක් වූ ප්‍රශ්නවල ඉදිරිපත් කර ඇති ප්‍රකාශ දෙකෙන්,**

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදිය. | වැරදිය. |
| (2) | නිවැරදිය. | නිවැරදිය. |
| (3) | වැරදිය. | වැරදිය. |
| (4) | වැරදිය. | නිවැරදිය. |
| (5) | නිවැරදිය. | නිවැරදි වන අතර පළමුවැන්න විස්තර කරයි. |

**ඉහත උපදෙස් සම්පිණ්ඩනයට අනුව අංකය ඉදිරියෙන් ඇති වරහනේ ලියන්න.**

(31) (1) 15 වන සියවසේ දේශ ගවේෂණය ප්‍රෙස්ටර් ජෝන් යටතේ සිදු විය.

(2) ශුද්ධ රෝම අධිරාජ්‍යයේ බලය ව්‍යාප්ත වීම 30 අවුරුදු යුද්ධයෙන් පසු සිදු විය. (......)

(32) (1) ග්‍රීක නීතිය පුරාණ ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම කාර්යයකි.

(2) බර්ජිල් හා හොරස් පුරාණ රෝමයේ ප්‍රසිද්ධ කවියෝ වූහ. (......)

(33) (1) 1949 දී NATO පිහිටුවන ලදී.

(2) බර්ලින් තාප්පය බිඳ වැටීමෙන් පසු නැවත බටහිර සහ නැගෙනහිර ජර්මනි එක්සත් විය. (......)

(34) (1) පැරසෙල්සස් රුධිර සංසරණය සොයා ගත්තේ ය.

(2) I වන චාල්ස් රජු උත්කෘෂ්ට විප්ලවයේ දී හිස ගසා මරා දමන ලදී. (......)

(35) (1) නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයෙන් උපන් දරුවා ලෙස හඳුන්වා ඇත.

(2) ප්‍රංශ විප්ලවයට බොනපාට්ගෙන් ලැබුණේ සුවිශේෂී සේවයකි. (......)

- **පහත උපදෙස් සම්පිණ්ඩනයට අනුව 36 - 40 තෙක් වූ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (D) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

(36) පහත දැක්වෙන අය අතුරෙන් රෝම අධිරාජයන් වන්නේ,

(A) නීරෝ (B) මාකස් අවුරේලියස්

(C) පයිතගරස් (D) වර්ජිල් (......)

(37) එංගලන්තයේ රජවරු වන්නේ,

(A) VIII වන හෙන්රි (B) XIV වන ලුවී

(C) XVIII වන චාල්ස් (D) III වන ජෝර්ජ් (......)

(38) ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ වන්නේ,

(A) ශක්තිමත් ස්ථාවර හමුදාව (B) මධ්‍යම ආණ්ඩුව

(C) ස්වාධීන විදේශ ප්‍රතිපත්තිය (D) වැඩවසම් රදළ පන්තිය (......)

(39) ජයානා සම්මේලයට සහභාගි වූ යුරෝපීය නායකයෝ,

(A) XVIII ලුවී (B) ටැලිරැන්ඩ්

(C) කාසල්රී (D) කැනිය (......)

(40) තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල අතරට ගැනෙන්නේ,

(A) යුරෝපයේ ආගමික යුද්ධ තව දුරටත් ඇතිවිය.

(B) ජර්මනිය එක්සත් වීම.

(C) ප්‍රංශය යුරෝපයේ බලවත් වීම.

(D) ශුද්ධ රෝම අධිරාජ්‍යය නාමික ආයතනයක් බවට පත් වීම. (......)

(ලකුණු 40)

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න 03 කටත් පිළිතුරු සපයන්න.**

## II කොටස

(01) ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කර නම් කොට ඒවායින් **ඕනෑම දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(1) නෝර්වේ
(2) මැන්චෙස්ටර්
(3) බර්ලින්
(4) ජිනෝවා
(5) ටයිබර් ගඟ
(6) ආද්‍රියාතික් මුහුද
(7) සිසිලි දූපත
(8) ශාන්ත පීටර්ස්බර්ග්

(සිතියම් ලකුණු කිරීමට ලකුණු 01 × 08 / කෙටි සටහන් සඳහා ලකුණු 05 × 02 = ලකුණු 10)

(02) (1) දේශ ගවේෂණ ව්‍යාපාරයට මුල් කාලීන යුරෝපය සම්බන්ධ වූ ආකාරය පහදන්න. (ලකුණු 06)

(2) දේශ ගවේෂණ තුළින් උද්ගත වූ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(03) (1) ප්‍රංශ විප්ලව සමයේ ප්‍රංශය තුළ පැවති සමාජ ව්‍යුහය සැකවින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(2) ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල විවේචනාත්මකව විමසන්න. (ලකුණු 08)

(04) (1) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇති වීමට තුඩු දුන් හේතු මොනවා ද? (ලකුණු 06)

(2) කාර්මික විප්ලවය සිදු වූ ක්ෂේත්‍ර හා ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(05) (1) ප්‍රොතෙස්තන්ත රෙපරමාදු ඇති වීමට තුඩු දුන් දේශපාලන හා ආර්ථික හේතු සැකවික් දක්වන්න. (ලකුණු 06)

(2) එහි ප්‍රතිඵල විස්තර කරන්න. (ලකුණු 08)

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ සිතියම.

## යුරෝපා සිතියම

